# විශේෂ නිවේදනයයි

කොරියානු රැකියා අපේක්ෂකයින්ගේ නව වීසා අයදුම්පත්වල තොරතුරු හා නව ඡායාරූප කොරියානු වෙබ් අඩවියට ඇතුලත් කිරීම හා සම්බන්ධවයි.

මේ දක්වා වෙබ් අඩවියේ ලියාපදිංචි වී සිටින කොරියානු රැකියා අපේක්ෂකයින් සඳහා කොරියානු රජය විසින් නව වීසා අයදුම්පතක් හඳුන්වා දී ඇත. මෙම අයදුම්පත කොරියානු වෙබ් අඩවියේ සිටින සියළුම රැකියා අපේක්ෂකයින් විසින් සම්පූර්ණ කළයුතු අතර, ඒ සමග පසුබිම සුදු පැහැති පාස්පෝට් ප්‍රමාණයේ (3.5cm × 4.5cm)ඡායාරූප 2ක් ඉදිරිපත් කිරීම අනිවාර්යයා වේ.

මේ වනවිටත් කෙටි පණිවිඩ තුළින් මේ පිළිබඳව ඔබව දැනුවත් කරඇත.

එබැවින් මේ දක්වා වීසා අයදුම්පත් සම්පූර්ණ කර ඒ සමඟ අදාළ ඡායාරූප ලබානොදුන් සෑම අයදුම්කරුවෙකුම 2018.07.15 වන දිනට පෙර කාර්යාංශය වෙත ලබාදෙන ලෙස මින් දන්වා සිටින අතර, එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් කොරියානු වෙබ් අඩවියට ඇතුලත් කිරීමට නොහැකිවන බැවින් ඔවුන්ගේ රැකියා අවස්ථාව අහිමිවිය හැකිය.